# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1003/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 14/06/2024<br>පැය1220 |

## 2024.06.05 වන දිනට යෙදුනු ජගත් පරිසර දිනට සමගාමීව මීගමුව වෙරළ තීරය පවිත්‍ර කිරීමේ වැඩසටහන

2024.06.05 වන දිනට යෙදුණු ජගත් පරිසර දිනයට සමගාමීව මීගමුව වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් පොලිස්පති දේශබන්දු තෙන්නකොන් මහතාගේ ප්‍රධානත්වයෙන් සහ 2024.06.14 වන අද දින උදෑසන 06.30ට දුංගල්පිටිය පොලිස් වසමේ කැපුම්ගොඩ සරක්කුකන්ද වෙරළතීරයේදී පැවැත්විණි.

මේ සඳහා පූර්ණ අනුග්‍රහය දක්වන INSEE Cement & INSEE Ecocycle ආයතනය හා පොලිසියත් සමඟ එක්ව 2024.06.05 වන දිනට යෙදුණු ලෝක පරිසර දිනය වෙනුවෙන් දුංගල්පිටිය පොලිස් වසමේ කැපුම්ගොඩ සරක්කුකන්ද වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනට දුංගල්පිටිය, පිටිපන හා බසියාවත්ත විදුහල් වල සිසු සිසුවියන්, ප්‍රදේශයේ ප්‍රජා කමිටු සාමාජිකයින් හා පොලිස් නිලධාරීන් ඇතුළු 1000කට ආසන්න පිරිසක් සහභාගී විය .

මෙම අවස්ථාවට සහභාගී වූ පාසල් සිසුන් සඳහා INSEE Cement & INSEE Ecocycle ආයතනය විසින් වටිනා සහතික පත්‍රයක් පිරිනැමූ අතර දුංගල්පිටිය හා ප්‍රීතිපුර පොලිස් වසම් වල පාසල් 14ක ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් සිමෙන්ති කොට්ට 280 ක් බෙදා දීම සංකේතාත්මක සිදු කෙරිණි. වැඩසටහනට සහභාගී වූ පුද්ගලයින් හට සමරු තිළිණයක් ලෙස හිස්වැසුම් ලබා දීමද සිදු කරන ලදි.

මෙම අවස්ථාවට INSEE Cement සමාගමේ සභාපති - නන්දන ඒකනායක මහතා, ප්‍රධාන විධායක නිලධාරී (CEO) - Jan Kunigk මහතා සහ INSEE Ecocycle ආයතනයේ සාමාන්‍යාධිකාරී සුජිත් ගුණවර්ධන මහතා ඇතුළු මෙම ආයතනයේ සාමාජිකයින් රැසක් හා බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහින්ද ගුණරත්න මහතා, ප්‍රජා පොලිස් සංචාරක හා ආයෝජන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අසංග කරවිට මහතා, බස්නාහිර පළාත් උතුර නියෝජ්‍ය පොලිස්පති කපිල කඩුපිටිය මහතා, නාවික හා සංචාරක නියෝජ්‍ය පොලිස්පති සමුද්‍රජීව මහතා , පොලිස් මාධ්‍ය ප්‍රකාශක හා අපරාධ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති නිහාල් තල්දූව මහතා, කැලණිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඒ.ජේ.වයි.බී. ක්‍රිෂාන්ත මහතා, මීගමුව කොට්ඨාස භාර පොලිස් අධිකාරී එරික් පෙරේරා මහතා ඇතුළු පොලිස් නිලධාරීන් රැසක් ද සහභාගී විය .

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.